# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2230/12 - 2021 ජුනි මස 03 වැනි බ්‍රහස්පතින්දා - 2021.06.03

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව**

නිවේදනය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ පිළිවෙලින් 44 (1), 45 (1) සහ 47 (1) (අ) (ආ) ව්‍යවස්ථාවන්ට අනුකූලව, මා වෙත පැවරී ඇති බලතල ක්‍රියාත්මක කරමින්, මවිසින් 2020 අගෝස්තු මස 09 දිනැති අංක : 2187/27 දරන අති විශෙෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නිවේදනය, වරින් වර සංශෝධනය කරන ලදුව, 2021 ජුනි මස 03 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි පහත සඳහන් ලෙස තවදුරටත් සංශෝධනය කරනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

**ගෝඨාභය රාජපක්ෂ,**
ජනාධිපති.

2021 ජුනි මස 03 වැනි දින
ජනාධිපති කාර්යාලය
කොළඹ - 01.

1A - G 34391 — 385 (2021/06)
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

(1) එම නිවේදනයේ "ජනාධිපති කාර්යාලය - ජාතික ප්‍රමුඛතා" ශීර්ෂය යටතේ වන "04. ආයතනික හා නෛතික රාමුව" සම්බන්ධයෙන් පහත පරිදි :-

**04. ආයතනික හා නෛතික රාමුව**

| *ආයතන/අස්ථිත්වයන්* | *ක්‍රියාත්මක කළයුතු නීති සහ අණ පනත්* |
|---|---|
| 1. ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය<br>2. කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව<br>3. ත්‍රිවිධ හමුදා සාමාජිකයින් කොරෝනා වෛරසය ආසාදනයෙන් වළක්වා ගැනීම සඳහා සෑම හමුදාවක් විසින්ම ගත යුතු ක්‍රියා මාර්ග අධ්‍යයනය කර එකී පියවර ක්‍රියාත්මක කිරීම සඳහා උපදෙස් ලබාදීම පිණිස වන ජනාධිපති කාර්ය සාධක බලකාය<br>4. සුරක්ෂිත රටක්, විනය ගරුක, ගුණ ගරුක හා නීති ගරුක සමාජයක් ගොඩනැගීම සඳහා වන ජනාධිපති කාර්ය සාධක බලකාය<br>5. කොවිඩ් - 19 අමාත්‍යාංශ කාර්ය සාධක බලකාය<br>6. නැගෙනහිර පළාත තුළ පුරාවිද්‍යාත්මක උරුමය කළමනාකරණය සඳහා වන ජනාධිපති කාර්ය සාධක බලකාය<br>7. ශ්‍රී ලංකාවේ අධ්‍යාපන කටයුතු පිළිබඳ ජනාධිපති කාර්ය සාධක බලකාය<br>8. ආර්ථික පුනර්ජීවනය හා දරිද්‍රතාවය තුරන් කිරීම සඳහා වන ජනාධිපති කාර්ය සාධක බලකාය<br>9. ගම සමග පිළිසඳර ග්‍රාමීය සංවර්ධන ජනාධිපති කාර්ය සාධක බලකාය<br>10. දේශගුණික විපර්යාසයන්ට තිරසාර විසඳුම් සහිත හරිත ශ්‍රී ලංකාවක් ඇතිකිරීමේ ජනාධිපති කාර්ය සාධක බලකාය<br>11. ජාතික සංවර්ධන ප්‍රමුඛතා සහ ස්වයං රැකියා හා පාරම්පරික වෘත්තීන්හි නියැලෙන කුඩා ආර්ථික ජීවනෝපාය අවශ්‍යතා වෙනුවෙන් භූ සම්පත් යොදා ගැනීම සහ ඒවා ලබා ගැනීමේ මූලාශ්‍ර හා ක්‍රමවේදයන් අධ්‍යයනය කිරීම සඳහා වන ජනාධිපති කාර්ය සාධක බලකාය<br>12. කොවිඩ් - 19 ජාතික එන්නත්කරණ සැලැස්ම ක්‍රියාත්මක කිරීම සඳහා වන ජනාධිපති කාර්ය සාධක බලකාය | ▪ මහ කොළඹ ආර්ථික කොමිෂන් සභා නීතිය (ආයෝජන මණ්ඩලය නීතිය) (1978 අංක 4)<br>▪ කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව පනත (2021 අංක 11) |

(2) එම නිවේදනයෙහි අංක "2.0 තාක්ෂණ අමාත්‍ය" ශීර්ෂය යටතේ වන "04. අදාළ ආයතනික හා නෛතික රාමුව" සම්බන්ධයෙන් පහත පරිදි;

04. අදාළ ආයතනික හා නෛතික රාමුව

| *ආයතන/අස්ථිත්වයන්* | *ක්‍රියාත්මක කළයුතු නීති සහ අණ පනත්* |
|---|---|
| 1. ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව සහ අනුබද්ධිත ආයතන<br>2. තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනය හා ඊට අනුබද්ධිත ආයතන<br>3. ශ්‍රී ලංකා පරිඝනක හදිසි ප්‍රතිචාර සංසදය<br>4. ශ්‍රී ලංකා ටෙලිකොම් සමාගම හා එහි පාලිත සමාගම් සහ ආශ්‍රිත ආයතන<br>5. පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව | ▪ ශ්‍රී ලංකා විදුලි සංදේශ පනත (1991 අංක 25)<br>▪ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ පනත (2003 අංක 27)<br>▪ ඉලෙක්ට්‍රොනික් ගනුදෙනු පනත (2006 අංක 19)<br>▪ පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ පනත (1968 අංක 32) |

(3) එම නිවේදනයෙහි අංක "2.0 තාක්ෂණ අමාත්‍ය" ශීර්ෂයට පසු පහත නව ශීර්ෂය හා ඒ යටතේ වන "01. කාර්යයන් හා කර්තව්‍යයන්, 02. සුවිශේෂී ප්‍රමුඛතා සහ 03. අදාළ ආයතනික හා නෛතික රාමුව" ඇතුලත් කිරීමෙන්;

2.1 ඩිජිටල් තාක්ෂණ හා ව්‍යවසාය සංවර්ධන රාජ්‍ය අමාත්‍ය

01. කාර්යයන් හා කර්තව්‍යයන්

තාක්ෂණ අමාත්‍යවරයාගේ උපදෙස් හා මඟපෙන්වීම මත "තාක්ෂණ ව්‍යාපාර ව්‍යවසායකත්වය කේන්ද්‍රකරගත් ආයෝජන හා ආශ්‍රිත සේවා ව්‍යවසායයන් ප්‍රවර්ධනය" කිරීම සඳහා අදාළ නීති සහ අණපනත්වලට අනුකූලව ඩිජිටල් තාක්ෂණ හා ව්‍යවසාය සංවර්ධන විෂයට අදාළව ප්‍රතිපත්ති සම්පාදනයට සහයවීම, ජාතික අයවැය , රාජ්‍ය ආයෝජන හා ජාතික සංවර්ධන වැඩපිළිවෙල යටතේ ඇති ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සහ පහත දැක්වෙන දෙපාර්තමේන්තු, රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත ආයතනයන්හි විෂයයන් හා කාර්යයන් හා ඊට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම

02. සුවිශේෂී ප්‍රමුඛතා

1. ඩිජිටල් තාක්ෂණ ව්‍යාපාර පුළුල් කිරීම මගින් විදේශ ආදායම් ඉපදවීම සහ ඉහල ආදායම් සහිත රැකියා සඳහා තරුණ තරුණියන්ට යොමුවීමට ඇති ඉඩ ප්‍රස්ථාව පුළුල් කිරීම

2. අපනයන කළාප වල හා ඉන් පිටත ක්‍රියාත්මක වන ආයෝජන මණ්ඩලය අනුමත කර ඇති අපනයන ව්‍යාපාරවල උපරිම නිෂ්පාදන ධාරිතාව යොදාගැනීමට ඇති විවිධ ආයතනික ගැටළු විසඳීම මෙන්ම එම ව්‍යාපාර වල නිරතවන සෘජු හා වක්‍ර රැකියා කරන තරුණ තරුණියන් ගේ සෞඛ්‍යය, නේවාසික සහ ප්‍රවාහන සේවා ගැටළු කඩිනමින් විසඳීම

3. දිස්ත්‍රික් ලේකම්වරුන්, ප්‍රාදේශීය ලේකම්වරුන් සහ අනෙකුත් සියළු ප්‍රාදේශීය හා පළාත් සභා මට්ටමේ රාජ්‍ය ආයතන ප්‍රධානීන් සම්බන්ධීකරණය කරමින් අපනයන හා දේශීය නිෂ්පාදන කර්මාන්ත, සේවාවන්, ඉදිකිරීම් ස්ථාන, මුහුණ දෙන ගැටළු විසඳීම මගින් විදේශ විනිමය ඉපයීම් මෙන්ම විදේශ විනිමය ඉතිරි කර ගැනීමට දායක වන ව්‍යාපාර පරිසරය ශක්තිමත් කිරීම

**03. ආයතනික හා නෛතික රාමුව**

| *ආයතන/අස්ථිත්වයන්* | *ක්‍රියාත්මක කළයුතු නීති සහ අණ පනත්* |
|---|---|
| 1. කාර්මික තාක්ෂණ ආයතනය<br>2. ශ්‍රී ලංකා ඉන්ස්ටිටියුට් ඔෆ් නැනෝ ටෙක්නොලොජි ප්‍රයිවට් ලිමිටඩ්<br>3. ජාතික විද්‍යා හා තාක්ෂණ කොමිෂන් සභාව<br>4. ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය<br>5. ශ්‍රී ලංකා ඉන්ස්ටිටියුට් ඔෆ් බයෝටෙක්නොලොජි ප්‍රයිවට් ලිමිටඩ්<br>6. සියලු තොරතුරු තාක්ෂණ උද්‍යාන | ■ විද්‍යාව හා තාක්ෂණය වැඩිදියුණු කිරීමේ පනත (1994 අංක 11)<br>■ ශ්‍රී ලංකා ප්‍රමිති ආයතන පනත (1984 අංක 6) |

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.